තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ  කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

**බී. ඒ. අනුර සේනාරත්න බාලසූරිය එ. ලංකා බැංකුව**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම) 1441/2019 (2019.10.22 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ  කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ  එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - බී. ඒ. අනුර සේනාරත්න බාලසූරිය
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, ලංකා බැංකුව

**පෙනීසිටීම**
අභියාචක - බී. ඒ. අනුර සේනාරත්න වෙනුවෙන් නීතිඥ එරික් බාලසූරිය
පොදු අධිකාරිය - එම්. ආර්. එන්. රෝහණ කුමාර සහකාර සාමාන්‍යාධිකාරී, එල් ජී දයාජිනී පීරිස් ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනි, ගයානි රණසිංහ ජ්‍යෙෂ්ඨ කළමනාකාර, වී ජී ජී ඩී විතාන , ආර් ආර් එච් ටී රත්නායක

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.09.04 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.09.04/ 2018.09.28 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.10.08 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.10.15 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.01.02 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.09.04 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *2011.09.04 දිනැති චෝදනා පත්‍රයට නිවැරදිකරු බව කියමින් අභියාචක පිළිතුරු සැපයීමෙන් පසුව ආරම්භ කල අභ්‍යන්තර විනය පරීක්ෂණයේ සියලු සාක්ෂි හා අභියාචකගේ පිළිතුරු ලබා ගැනීමෙන් අනතුරුව එම පරීක්ෂණයේ පරීක්ෂණ නිලධාරී ලෙස කටයුතු කල ඩබ්.ජේ.සී. ප්‍රනාන්දු මහතා විසින් ලබා දුන් අවසන් වාර්තාවේ සහතික පිටපතක්.*
2. *අභ්‍යන්තර විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු ලංකා බැංකුවේ විනය අධිකාරිය මගින් කොළඹ මහාධිකරණයේ මේ සම්බන්ධව විභාග වුනු HC 1427/2003 දරණ නඩුවේ තීරණය ලබෙනතුරු එම විනය පරීක්ෂණයේ තීරණය ප්‍රකාශයට පත් කිරීම කල් තැබූ බව* 2017/12/05 *දිනැති ලිපියෙන් අභියාචක වෙත දැනුම් දුන් අතර එසේ නම්* 2018/05/03 *වන දින කොළඹ*

*මහාධිකරණය මගින් එම නඩුවෙන් මා නිදොස් කොට නිදහස් කිරීමෙන් පසු එම පරීක්ෂණයේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට විනය අධිකාරිය විසින් පියවර ගෙන තිබේද යන වග ?*

3. *එසේ ප්‍රකාශයට පත් කර තිබේ නම් එම තීන්දුවේ පිටපතක්.*
4. *එසේ ප්‍රකාශයට පත් කර නොමැති නම්, එම නඩුව මගින් ම නිදොස් කොට නිදහස් කර මේ වන විට මස 3කට වැඩි කාලයක් ගත වී ඇතත් එලෙස නඩුව අවසන් වන තුරු අත්හිටවූ විනය පරීක්ෂණයේ තීන්දුව ප්‍රකාශයට පත් නොකිරීමට හේතු ?*
5. *එසේ ප්රකාශයට පත් කර නොමැති නම්, කල් තැබූ අභ්‍යන්තර විනය පරීක්ෂණයේ අවසන් තීන්දුව ප්‍රකාශයට පත් නොකරන්නේද යන වග හා ප්‍රකාශයට පත් කරන්නේනම් එය ප්‍රකාශයට පත් කරන දිනය ?*

තොරතුරු නිලධාරියා 2018.09.04 දිනැතිව තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වූ අතර, 2018.09.28 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ අභියාචකට එරෙහිව ඇති විනය කටයුත්ත, විනය බලධාරියා වෙත නුදුරු දිනයකදී යොමු කිරීමට සැලසුම් කර ඇති අතර ඒ අනුව තොරතුරු ඉල්ලීමෙහි 2, 3, 4, හා 5 යන ඉල්ලීම්වලට පිළිතුරු ලැබෙන බවයි. තවද අභියාචක විසින් ඉල්ලා සිටින ලද වාර්තාව තොරතුරු පනතේ 5 (2 ඌ) (1) ප්‍රතික්ෂේප කරන බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක **2018.10.08** දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2018.10.15 දිනැතිව ප්‍රතිචාර දක්වමින්, ඉල්ලීමෙහි අංක 1, 5 (1) ඊ වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කර, අයිතම අංක 2 සිට 5 දක්වා තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ නොමැති බව පවසා සිටින ලදී. මෙම තීරණයෙන්ද අභියාචක සැහීමකට පත් නොවූ හෙයින් 2019.01.02 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය සහ අභියාචක පැමිණි සිටින ලදී.

පොදු අධිකාරිය 2019.09.25 දිනැති ලිපිය මගින් අභියාචකට එරෙහිව පැවති විනය පරීක්ෂණයට අදාළ තීරණය 2018.07.18 දිනැතිව ආභියාචක වෙත දැනුම් දී ඇති අතර එමගින් තොරතුරු ඉල්ලීමෙහි කරුණු අංක 2, 3, 4 හා 5 අයිතමයන්ට එමගින් පිළිතුරු සැපයෙන බව දන්වා ඇති බව නිරීක්ෂනය විය**.**

මෙම තොරතුරු ඉල්ලීමට පසුබිම් වූයේ පොදු අධිකාරිය විසින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත සිදු කරන ලද පැමිණිල්ලක් හේතුවෙන් අභියාචක අත්අඩංගුවට ගෙන පසුව නිවරදකරු වීම මත නිදහස් කිරීමෙන් අනතුරුව සිදු කරන ලද අභ්‍යන්තර විනය පරීක්ෂනයක් බව කරුණු දක්වා සිටින ලදී.

පොදු අධිකාරිය වෙනුවෙන් කරුණු දක්වමින් පවසා සිටියේ පොදු අධිකාරියෙහි විනය කාර්යයපටිපාටිය අනුව මෙම විනය පරීක්ෂණ වාර්තාව ලබා දිය හැකි වන්නේ එම පරීක්ෂණයට අදාළ සහකාර සාමාන්‍යාධිකාරී වෙත බවත්**,** වෙනත් කිසිදු පුද්ගලයෙකුට මෙම වාර්තා ලබා නොදෙන බවත්ය.

පොදු අධිකාරිය විසින් මෙම වාර්තාව ලබා දීම **5 (1)** ඌ **(1)** සහ **5 (1) (**ඊ**)** වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී. තවද පරීක්ෂණ නිලධරයාගේ පෞද්ගලිකත්වයට හානියක් සිදු විය හැකි බව පොදු අධිකාරියෙහි මතය විය.
එනමුත් පරීක්ෂණ නිලධරයා තෙවන පාර්ශවයක් නොවන බැවින් **5 (1) (**අ) වගන්තිය අදාළ නොවන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී.
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ **5 (1)** ඌ **(1)** සහ **5 (1) (**ඊ**)** වගන්තීන් ප්‍රකාරව ද මෙම තොරතුරු මුක්ත නොවන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණය විය.

මේ සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් සඳහා පොදු අධිකාරිය කල් ඉල්ලා සිටින ලදී.

**නියෝගය:**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ **5 (1)** (අ) **, 5 (1)** ඌ **(1)** සහ **5 (1)** (ඊ) වගන්තියන් ප්‍රකාරව මෙම තොරතුරු මුක්ත නොවන බවත් සාමාන්‍ය ක්‍රියා පටිපාටිය අනුව අවසන් විනය පරීක්ෂණ වර්තාවක පිටපතක් ලබා ගැනීමට අයිතියක් ඇති බවත් යන කොමිෂන් සභාවෙහි නිරීක්ෂණයන් පොදු අධිකාරියෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කොට උපදෙස් ලබා ගැනීම සඳහා කල් ලබා දෙනු ලැබේ.

අභියාචන කටයුතු කල් තබනු ලැබේ.

මීළඟ විභාග කිරීමේ දිනය: 2020.03.10

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
***********